④ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2302/17 - 2022 ඔක්තෝබර් මස 19 වැනි බදාදා - 2022.10.19
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 21/1978 (X) (ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද සහ අංක 30ඒ, මලලසේකර මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2013 මාර්තු මස 12 වැනි දින අංක 1801/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (විශේෂ)" හා "ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය)" යන උපාධි පාඨමාලාවන් සහ ඊට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන උපාධි පාඨමාලාවක් සඳහා වන කෙටි යෙදුම් සඳහා පහත දැක්වෙන උපාධි පාඨමාලාවන් සහ උපාධි පාඨමාලාවන් සඳහා වන කෙටි යෙදුම් ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාවන්* | *II වන තීරය*<br>*උපාධි පාඨමාලාවන් සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ ගෞරව උපාධිය | බීඒඒ ගෞරව |
| ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ උපාධිය | බීඒඒ |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0173/1

1A - PG 6012 — 286 (2022/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්.ඩී-බී. 21/1978 (X) (ඈ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 1437 සහ කොළඹ 04, ආර්. ඒ. ද මෙල් මාවත, ද ක්‍රෙස්ටර් පෙදෙස, අංක 36 යන ස්ථානයෙහි පිහිටා ඇති ආයතනයක් වන ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඈ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2020 සැප්තැම්බර් මස 25 වැනි දින අංක 2194/72 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 6 වන මට්ටම) මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ "(S)" තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම ; හෝ

   (ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇදුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ "(S)" තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරුකරණය) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0173/2

එල්.ඩී-බී. 21/1978 (X) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කොට ඇති, ලියාපදිංචි අංක පී. එල්. 24 දරන උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 අගෝස්තු මස 17 වැනි දින අංක 2293/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව, I වන තීරයේ දක්වෙන, "තොරතුරු තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

 (අ) පරිගණක පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අවම අධ්‍යයන සම්භාර 120ක් සහිතව (ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (එස්එල්කිවුඑෆ්) 6 වන ස්ථරයේ), ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යාව විෂය ධාරාවෙන් සම්මාන සාමාර්ථ "(සී)" දෙකක් (2) සහ සාමාන්‍ය සාමාර්ථයක් "(එස්)" එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය;

 (ආ) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (එස්එල්කිවුඑෆ්) නිශ්චිතව සඳහන් පරිදි, පහත සඳහන් ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම්වලින් එක් සුදුසුකමකට අනුකූලව කටයුතු කළ යුතු ය :-

  (i) ව්‍යාපාරවේදය හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක දර්ශනපති උපාධියක්; හෝ

  (ii) අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ කුසලතා පිළිබඳ සාක්ෂි සමග ව්‍යාපාර හෝ වෙනත් සම්බන්ධිත ක්ෂේත්‍රයක (එස්එල්කිවුඑෆ්) 9 සහ 10 හෝ ඒ හා සමාන ස්ථරයක පශ්චාත් උපාධියක්; හෝ

  (iii) සම්බන්ධිත ක්ෂේත්‍රයක පර්යේෂණ කුසලතා සාක්ෂි සමග 0 - 4.0 පරිමාණයේ 3.7 ක අවම ජී.පී.ඒ. අගය සහිත ව්‍යාපාර හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (එස්එල්කිවුඑෆ්) 6 වන ස්ථරයේ විද්‍යාවේදී ගෞරව උපාධියක්; හෝ

  (iv) ව්‍යාපාරවේදය හෝ අදාළ ක්ෂේත්‍රයක දර්ශනපති උපාධිය හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති තැනැත්තකු විසින් දරනු ලබන ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්හි (එස්එල්කිවුඑෆ්) 6 වන ස්ථරයේ හෝ සමාන ස්ථරයක ගෞරව උපාධියක්, යම් තැනැත්තෙකුගේ පර්යේෂණ කුසලතා විශිෂ්ඨ මට්ටමක තිබීම මත, දර්ශනපති උපාධිය සඳහා ස්ථිර ලෙස ලියාපදිංචි වීමෙන් අවම වශයෙන් මාස දහඅටක අවම කාල සීමාවකින් දර්ශන විශාරද උපාධියක මට්ටමට උසස් කරනු ලැබිය හැකි ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| පරිගණක පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (පරිගණක පද්ධති ඉංජිනේරු විද්‍යාව) |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය | පීඑච්ඩී (ව්‍යාපාර පරිපාලනය) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0173/3

---

එල්.ඩී-බී. 21/1978 (X)(ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී. බී. 4833 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2022 අගෝස්තු මස 25 වැනි දින අංක 2294/52 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කළමනාකරණය පිළිබඳ ආචාර්ය" සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

I වන උපලේඛනය

**කොන්දේසි**

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

   (i) අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 6 වන මට්ටම) ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කලමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

      (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේ දී වාණිජ්‍ය විෂයය ධාරාවෙන් "සාමාන්‍ය සාමාර්ථ" '(S)' තුනක් (3) එකවර ලබා තිබීම හේ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවක් යටතේ "සාමාන්‍ය සාමාර්ථ" '(S)' තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(ii) අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 6 වන මට්ටම) ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ කළමනාකරණ ගෞරව උපාධිය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවක් යටතේ "සාමාන්‍ය සාමාර්ථ" '(S)' තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් (5) අවුරුදු ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

### II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කලමනාකරණ ගෞරව | බීඑම්ජීටී ගෞරව (ව්‍යාපාර විශ්ලේෂණය) |
| ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ කලමනාකරණ ගෞරව | බීඑම්ජීටී ගෞරව (ව්‍යවහාරික ආර්ථික විද්‍යාව) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0173/4